C
371.75



# කනිෂ්ඨ පාසල් ශිෂ්‍යයන්ගේ සමාජ අධ්‍යයන ඉගෙනුම් ශෛලී, විෂය සාධනය හා ආකල්ප පිළිබඳ අධ්‍යයනයක්.

බී.ඇම්. රත්නපාල

බී.ඒ.(සාමාන්‍ය), අධ්‍යාපන ඩිප්ලෝමා.

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්ව විද්‍යාලය මගින් 1981 වර්ෂයේ පවත්වන ලද ශාස්ත්‍රපති (අධ්‍යාපන) පරීක්ෂණයේ අවශ්‍යතා අර්ධවශයෙන් පූරණය කිරීමට පිළියෙළ කැරුණු පර්යේෂණ කෘතියකි.

371915

## අධ්‍යයනයේ සාරාංශය.

කනිෂ්ඨ පාසල් ශිෂ්‍යයන්ගේ සමාජ අධ්‍යයන ඉගෙනුම් ශෛලි, සමාජ අධ්‍යයනය විෂය සාධනය හා පාසල කෙරෙහි දක්වන ආකල්ප පිළිබඳ අධ්‍යයනයක් කිරීම අරමුණ විය.

මේ අනුව විමසීමට අපේක්ෂිත කල්පිත වූයේ,

(1) සමාජ අධ්‍යයනය විෂය හදාරන ශිෂ්‍යයන් තුළ විවිධ ඉගෙනුම් ශෛලි ඇත.

(2) එම ඉගෙනුම් ශෛලි එකිනෙකට ස්වාධීනය.

(3) එම ඉගෙනුම් ශෛලි සමාජ අධ්‍යයන විෂය සාධනය හා බැඳී පවතී.

(4) එම ඉගෙනුම් ශෛලි පාසල කෙරෙහි දක්වන ආකල්පය හා බැඳී පවතී,

යන සතරයි.

ප්‍රධාන වශයෙන් සමාජ අධ්‍යයන ඉගෙනුම් ශෛලි හඳුනාගැන්ම සිදුකළේ, ශිෂ්‍ය නිරීක්ෂණය මගිනි. ඊ සඳහා සාදාගත් නිරීක්ෂණ පත්‍රිකාවට පදනම්වූයේ අන්තර් ක්‍රියා විශ්ලේෂී සංකල්පයයි. මීඩ් ( Strauss,1964), ෆ්ලැන්ඩර්ස් (1970) හා ටිෂර් (1973) යන අයගේ අදහස්ද, ඩෝලන්,(1975) එග්ලස්ටන් (1975),පැටිස් (1976) ස්ලේටර් හා තොම්ප්සන් (1977) යන අයගේ පර්යේෂණද මෙම පර්යේෂණයට ඉමහත් මග පෙන්වීමක් විය. ශිෂ්‍ය නිරීක්ෂණයේදී මෙම විද්වතුන් දැක්වූ කරුණු ගැන සැලකිලිමත්විනි.

මෙම පර්යේෂණයට අදාළ ශිෂ්‍ය නියැදිය 62 කි. මහනුවර නගරයේ පාසල්වල 7 වන ශ්‍රේණියේ ශිෂ්‍යයෝ ඊට ඇතුළත් වූහ.

### අධ්‍යයනයේ ප්‍රතිඵල.

පළමුවන කල්පිතයෙන් දැක්වූ පරිදි කනිෂ්ඨ පාසල් ශිෂ්‍යයන් සතුව විවිධ සමාජ අධ්‍යයන ඉගෙනුම් ශෛලි ඇතිබව හෙළිවිය. පර්යේෂණ උපකරණය තනන අවස්ථාවේදීම එය හෙළිවූ බව කිව මනාය. ඉගෙනුම් ශෛලි 10 ක් හඳුනා ගනු ලැබුවත් පර්යේෂණයට අදාලකැර ගත්තේ ගුරුභවතුන් 60 ක් ලවා යුගල සැසඳුමකට ( Edwards, 1969) භාජනය කරනු ලැබීමෙන් පසු 1,2,3,4 යන ස්ථානගත් ඉගෙනුම් ශෛලී හතර පමණකි.

දෙවන කල්පිතය වූ මෙම ඉගෙනුම් ශෛලි එකිනෙකට ස්වාධීනය යන්න අඩවශයෙන් ස නාථවිනි. ස්වාධීනත්වය විමසුම සඳහා සහසම්බන්ධතාව ගණනය කිරීමත්, එහි වෙසෙසි බව විමසීමත් සිදුවිහි. වැඩි ස්වාධීනත්වයක් දැක්වූයේ නිරීක්ෂණයෙන් ඉගෙනුම හා පිටපත්කිරීමෙන් ඉගෙනුම යන ශෛලි දෙකයි. නිරීක්ෂණයෙන් ඉගෙනුම හා පිටපත්කිරීමෙන් ඉගෙනුම අතර සහසම්බන්ධතාව 0.23 ක්ද, නිරීක්ෂණයෙන් ඉගෙනුම හා සාකච්ඡාවෙන් ඉගෙනුම' අතර සහසම්බන්ධතාව 0.22 ක්ද විය. ඒ සහසම්බන්ධ-තා වෙසෙසිනොවිය. පිටපත්කිරීමෙන් ඉගෙනුම හා සාකච්ඡාවෙන් ඉගෙනුම අතර සහසම්බන්ධතාව 0.16 ක් වූ අතර එයද වෙසෙසි සහසම්බන්ධතාවක් නොවිය. එහෙත් පයෙෂණයේ 3 වන හා 4 වන කල්පිත විමසීමේදී ඉගෙනුම් ශෛලි 04හි ස්වා-ධීනත්වය යම් ප්‍රමාණයකින් තහවුරුවිණ.

තෙවන කල්පිතය වූ සමාජ අධ්‍යයනය ඉගෙනුම් ශෛලි සමාජ අධ්‍යයනය විෂය සාධනය හා සම්බන්ධතාවක් පවති යන්න විමසුමේදී සියලුම ඉගෙනුම් ශෛලි (04) හා සමාජ අධ්‍යයනය විෂය සාධනය අතර .01% මට්ටමේ වෙසෙසි බවක් ඇතිව සහ-සම්බන්ධතාවක් දක්වන බව හෙළිවිය. විශේදිතව සහසම්බන්ධදැයි ( differentially correlated )විමසූ කල්හි, .01% මට්ටමක වෙසෙසිබවකින් යුක්තව සහසම්බන්ධතා අතර වෙනසක් දුටුයේ පහත් පෙනෙන ඉගෙනුම් ශෛලින් අතර බව හෙළිවිය.

(1) නිරීක්ෂණයෙන් ඉගෙනුම හා සමාජ අධ්‍යයනය විෂය සාධනයත්, පිටපත්කිරීමෙන් ඉගෙනුම හා සමාජ අධ්‍යයනය විෂය සාධනයත් අතර සහසම්බන්ධතා දෙකෙහි වෙනස.

(2) නිරීක්ෂණයෙන් ඉගෙනුම හා සමාජ අධ්‍යයනය විෂය සාධනයත් සාකච්ඡාවෙන් ඉගෙනුම හා සමාජ අධ්‍යයනය විෂය සාධනයත් අතර සහසම්බන්ධතා දෙකෙහි වෙනස.

(3) පිටපත්කිරීමෙන් ඉගෙනුම හා සමාජ අධ්‍යයනය විෂය සාධනයත් සවන්දීමෙන් ඉගෙනුම හා සමාජ අධ්‍යයනය විෂය සාධනයත් අතර සහසම්බන්ධතා දෙකෙහි වෙනස.

(4) සාකච්ඡාවෙන් ඉගෙනුම හා සමාජ අධ්‍යයනය විෂය සාධනයත්,සවන්දීමෙන් ඉගෙනුම හා සමාජ අධ්‍යයනය විෂය සාධනයත් අතර සහසම්බන්ධතා දෙකෙහි වෙනස.

තෙවන කල්පිතය විමසීමේදී ලත් ප්‍රතිඵල නිසා ඉගෙනුම් ශෛලී අතර වෙනසක් ඇති බව හෙළිවිනි.

සිවුවන කල්පිතය වූ ඉගෙනුම් ශෛලී හා ආකල්ප බැඳී ඇති බව විමසීමේදී පහත සඳහන් ප්‍රතිඵල ලැබිණ.

පාසල කෙරෙහි දක්වන ආකල්ප හා සමග .01% මට්ටමෙන් වෙසෙසි සහ-සම්බන්ධතාවක් දැක්වූයේ නිරීක්ෂණයෙන් ඉගෙනුම හා සවන්දීමෙන් ඉගෙනුම යන ඉගෙ-නුම් ශෛලීයි. ආකල්ප හා සමග .05% ක මට්ටමෙන් වෙසෙසි සහසම්බන්ධතාවක් දැක්වූයේ සාකච්ඡාවෙන් ඉගෙනුමයි. පිටපත්කිරීමෙන් ඉගෙනුම ආකල්ප හා සමග වෙසෙ-සි සහසම්බන්ධතාවක් නොපැවේය.

එසේම සහසම්බන්ධතා දෙකක් අතර වෙනසෙහි වෙසෙසි බව විමසන්ම පහත පෙනෙන ප්‍රතිඵල දක්නට ලැබිණ. .05% මට්ටමෙන් විශේදිතව සහසම්බන්ධතාවෙහි වෙනසක් දැක්වූයේ,

(1) නිරීක්ෂණයෙන් ඉගෙනුම හා පාසැල කෙරෙහි දක්වන ආකල්පත්,සවන්දීමෙන් ඉගෙනුම හා පාසල කෙරෙහි දක්වන ආකල්ප ත් පිළිබඳ සහසම්බන්ධතාවන් දෙකෙහි වෙනස.

(2) පිටපත්කිරීමෙන් ඉගෙනුම හා පාසැලකෙරෙහි දක්වන ආකල්පත්, සවන්දීමෙන් ඉගෙනුම හා පාසල කෙරෙහි දක්වන ආකල්පත් පිළිබඳ සහසම්බන්ධතාවන් දෙකෙහි වෙනස.

(3) සාකච්ඡාවෙන් ඉගෙනුම හා පාසල කෙරෙහි දක්වන ආකල්පත්, සවන්දීමෙන් ඉගෙනුම හා පාසැල කෙරෙහි දක්වන ආකල්පත් අතර සහසම්බන්ධතාවන් දෙකෙහි වෙනස, යන තුනයි.

සිටුවන කල්පිතය විමසූ කල්හිද, ඉගෙනුම් ශෛලී අතර වෙනසක් ඇති බව හෙළිවිණ. සහසම්බන්ධතාව ගණනයට ගුණිත සූර්ණ සහසම්බන්ධතා සංගුණකය යොදා ගැනිණ. සහ-සම්බන්ධතා දෙකක් අතර වෙනස වෙසෙසිව, විශේදිතව පවතීද යන්න cochran (Lindquist, 1940 ) ඉදිරිපත් කළ සූත්‍රය ඇසුරෙන් විමැසිණ.

මෙම අධ්‍යයනයෙන් හෙළිවූ ප්‍රතිඵල වෙනත් විෂය ක්ෂෙත්‍ර පිළිබඳ ශිෂ්‍යයන්ගේ ඉගෙනුම් ශෛලී විමසීමට රුකුළක් වනු ඇත.